**කල්මුණේ මහනගර සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාව වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කල්මුණේ මහනගරසභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ ) ගිණුම්කරණ අඩුපාඩුව**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2016 වර්ෂයේ ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයෙන් ලැබියයුතු JCB යන්ත්‍ර කුලිරු. 93,000 ක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. | ලැබිය යුතු කුලි ගිණුම්ගත කළ යුතු වේ. | දැනුවත් කිරීම සිහි කැඳවීම් යවා ඇතත්, එම මුදල අයවී නැත. එම නිසා නීත්‍යානුකූලව කටයුතු කිරීමට තීරණය කර ඇත. |
| (ii) | 2011 – 2015 කාල පරිච්ඡේදයේ මහ නගර සභාව විසින් ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් කරෙයිතිවු ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ගාස්තු රු. 3,023,329 ක් ගෙවිය යුතු මුදලක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ගෙවිය යුතු මුදල මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. | අදාල ලියවිලි කිසිවත් නොමැති වීමෙන් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකිවී ඇත. මේ සම්බන්ධයෙන් කරෙයිතිවු ප්‍රාදේශීය සභාවට ලිඛිතව දැන්වීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | මහා නගර සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන කල්මුණේ ඉස්ලාමාබාත් මහා නගර ආයුර්වේද රෝහලේ 2018 දෙසැම්බර් 31 දිනට තිබු රු. 163,333 ක් වටිනා ආයුර්වේද බෙහෙත් තොග මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලවලදි නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 කාල පරිච්ඡේදයට අදාල කල්මුණේ ප්‍රදේශයේ වාහනවලින් අයවියයුතු හිඟ මුදල රු. 452,250 ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | අයවිය යුතු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ලෙජරය අනුව රු. 12,348,790 ක් වූවද, ආදායම් වියදම් ගිණුමේ එය රු. 9,222,054 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. | අයවිය යුතු වරිපනම් බදු ප්‍රමාණය අයකර ගැනීමට නීතියානුකූලව කටයුතු කර ඇත. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ කුලී, ආදායම් ලෙජරය අනුව රු. 15,592,099 ක් දක්වා තිබුණද, ආදායම් වියදම් ගිණුමේ රු. 15,261,361 ක් වශයෙන් දක්වා තිබුණි. | කුලී ආදායමේ ලෙජරය අනුව ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | අදාල මුදල අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට තීරණය කර ඇත. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

**--------------------**

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>--------------------------------------- |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාලව . මූල්‍ය ප්‍රකාශනවල හා උපලේඛනවල දැක්වෙන වටිනාකම අතර රු.16,751,454 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කල යුතු වේ. | මෙම හිඟය 1987 වර්ෂයේ සිට පවතින අතර සනාථ කිරීමට අවශ්‍ය කරුණු නොමැති බැවින්, මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකිව ඇත. |

**(ඇ)** විගණනය සඳහා අවශ්‍ය **ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**-----------------------------------------------------**

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------- |
|---|---|---|
| රු. 142,933,051 ක් වටිනා ගිණුම් විෂයයන් දෙකක් ඉඩම් ඔප්පු , ස්ථාවර වත්කම් ලේඛන සැසඳුම් ප්‍රකාශ හා කාල විශ්ලේෂණ නොමැති විමෙන් විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය / සන්නිරීක්ෂණය කිරීමට හොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | 2014 වර්ෂය පෙර විස්තර පැහැදිලිව නොතිබීමෙන් නිවැරදි ලෙස හඳුනාගැනීමට නොහැකිව ඇත. අදාල මුදල ආදායමට ගැනීමට කටයුතු කර ඇත. |

**1.4 අනුකූල නොවීම**

**------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------------**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| --------------------- | | ----------------- | ------------ | ---------------- |
| (අ) | මහානගර සභා ආඥා පනත<br>----------------- | | | |
| | වගන්තිය 218 | පරිපාලනය පිළිබඳ පිළියෙල කළයුතු විස්තරාත්මක වාර්තාව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. | අදාල පනත අනුව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියේ 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන චක්‍රලේඛය | එක් එක් පලාත් පාලන ආයතනය විසින් නාගරික සංවර්ධන යන නමින් බැංකු ගිණුමක් ආරම්භ කර සේවා ගාස්තු සහ දඩ මුදල් උක්ත ගිණුමේ තැන්පත් කළයුතු බව දැනුවත් කර තිබුණද, මහ නගර සභාව විසින් නගර සංවර්ධන යන නමින් ගිණුමක් ආරම්භකර ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය අනුව ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි මෙවැනි ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | අවුරුදු දෙකක් ඉක්මවූ රු. 32,710,231 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් අදාල පුද්ගලයන්ට ආපසු ලබා දීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4.843,893ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,431,998ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු.'000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම්හා බදු | 11,100 | 12,349 | 9,222 | 94,693 | 11,100 | 12,174 | 11,592 | 91,567 |
| කුලී | 19,980 | 15,592 | 15,261 | 39,123 | 19,980 | 16,637 | 15,621 | 38,792 |
| බලපත්‍රගාස්තු | 9,705 | 8,491 | 8,491 | - | 9,705 | 7,254 | 7,254 | - |
| වෙනත් ආදායම් | 45,275 | 34,435 | 34,435 | - | 43,255 | 24,295 | 24,295 | - |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකළයුතු ආදායම් රු. මිලියන 201.22 කින් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 67.41 ක් අයකර ගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය33% ක් විය. | සභාවේ ප්‍රධාන ආදායම් රුැස්කිරීම් වැඩිකිරීම් සඳහා තීරණ ගෙන රැස්කිරීමේ ප්‍රතිශතය වැඩිකිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභා ආඥා පනතේ වගන්ති 252(1)(ආ) අනුව මහා නගර සභා බල ප්‍රදේශයේ ඇති නිශ්චල දේපල සහ ඉඩම් 47,900 කින් වර්ෂයට අධික කාලයක සිට අයවිය යුතු වරිපනම් බදු රු. මිලියන 91.56 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර නොතිබුණි. | අදාල කාලයතුල හිඟ මුදල අයකිරීමට කටයුතු කළ යුතු වේ. | දැනට අයවීම් සිදු වෙමින් පවති. |

**2.2.4 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 1987 සිට හිඟව පවතින මහජන පොල බදු රු. 12,314,393 ක්, මස්කඩ බදු රු.7,661,912 ක්, කඩ කුලි රු. 13,657,443 ක් අයකිරීමට කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) 1996 සිට හිඟව පවතින බයිසිකල් සහ වාහන ආරක්ෂක බදු රු. 3,394,613 ක් අයකර නොගෙන දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහා නගර සභාවට අයත් පොදු වෙළඳ පොලෙහි තිබෙන කඩකාමර 503 කින් 64 ක් බදුගත් බදුකරුවන්ගෙන් රු. 5,130,143 ක් හිඟ වර්ෂ 7 කට වඩා වැඩි කාලයක සිට අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩ කාමර අළුත්වැඩියා කිරීමට ඇතිබැවින් හිඟ මුදල අයකිරීම් දුෂ්කර වී ඇත. |
| (ඇ) | මහජන පොලට යාබදව තිබෙන පුද්ගලික කඩ කාමරවල කඩ කුලිය මසකට රු. 10,000 සිට රු. 20,000 දක්වා ප්‍රමාණයක් පැවතියද, මහා නගර සභාවට අයත් මෙම කඩ කාමරඅළුතින් මිල ගණන කැදවීමකින් තොරව 1980 වර්ෂයේ සිට මාසිකව රු. 300 සිට රු. 2,500 ක් දක්වා පරාසයේ කුලියට දී තිබීමෙන් සභාවට රුපියල් මිලියන 60 ක් පමණ වාර්ෂිකව අහිමි වී ඇත. | සභාවේ ආදායම් අහිමිවීම අඩුකර ඉල්ලුම් අනුව කුලි වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 සිට කුලි වැඩිකර ඇත. |
| (ඉ) | 2018 වර්ශය මහා නගර සභා බලප්‍රදේශයේ තිබෙන එකතු වටිනාකම රු. 9,555,049 කට බදු දී තිබූ කඩ කාමර, මහජන පොල සහ රථ ගාල 74 ක් සම්බන්ධයෙන් සභාව විසින් ගිවිසුම් ගතවී නොතිබුණි. | කඩ, පොල සහ රථ ගාල සම්බන්ධයෙන් ගිවිසුම්ගත විය යුතු වේ. | ඉදිරියේදි ගිවිසුම් අත්සන් කර බදු දිමට කටයුතු කර ඇත. |

## 2.2.5 මුද්දර ගාස්තු
-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016, 2017 සහ 2018 වර්ෂය සඳහා කල්මුණේ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවෙන් ඍජුව සහ ජංගම සේවය මගින් අයකරගත් අතිරේක මුද්දර ගාස්තු මහා නගර සභාව විසින් ගණනය කර අදාල කාලය තුල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ මුද්දර ගැස්තු විස්තර දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයෙන් ලබා ගැනීමේ අපහසුතාවයන් දක්නට ලදි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය අනුව ප්‍රධාන කාරණ 42 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනැවිය යුතුව තිබූ නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පිළිබඳ යොජනා සකස්කර නැගෙනහිර පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්බන්ධ යෝජනා සකස් කර නැගෙනහිර පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතිය සඳහා යැවිය යුතු වේ. | 272:1 1: a, b, c, d, e යන සම්බන්ධව බලය 2013 දෙසැම්බර් 31 දින චක්‍රලේඛය මගින් පළාත් සභාව සතු විය. g, h, i සහ අනෙකුත් අනුමත කළ අතුරු ව්‍යවස්ථා මහ නගර සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලැබේ. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කරන කර්තව්‍යයන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කරළ් අනුව ක්‍රියා කළයුතු වේ. | මෙම අතුරු ව්‍යවස්ථා අනුව මෙම වර්ෂයේ අයවැය මගින් මේ විෂයයන් බලාපොරොත්තු වේ. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළයුතුයි. කෙසේ වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලඟා කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන එය මැනීම් සඳහා දර්ශක හඳුනාගෙන ඒවා ලඟා කර ගැනීමට කටයුතු කල යුතු වේ. | අනාගතයේදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්යාල ගොඩනැගිල්ල, මහජන පුස්තකාල මහජන පොල, ක්‍රීඩා පිටිය, රථ ගාල, පොහොර ප්‍රතිචක්‍රීය කරන මධ්‍යස්ථානය සහ ඝාතනාගාර පිහිටා තිබෙන ඉඩම්වල අයිතිය සභාවේ නමට මාරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ඉඩම්වල අයිතිය සභාවේ නමට මාරු කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | අයිතිය මාරුකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 2015 සහ 2016 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වා දුන් අස්ථාන ගතවූ පුස්තකාල පොත් 8,102 සහ අඩුකළ යුතු පොත් 1,205 ක් සම්බන්ධයෙන් වගකිය යුතු අයට එරෙහිව කටයුතු කර නොතිබුණි. | අදාල කාලය තුල ගැලපීම් කර පිරිවැය ස්ථාවර වත්කම් වලින් කපා හරි යුතුය. තවද, අස්ථාන ගත වූ පොත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදි කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | මහා නගර සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන මොටර් වාහන සහ යන්ත්‍ර 38 ක් මහ නගර සභාවේ නමට අයිතිය මාරු කර නොතිබුණි. | මහා නගර සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන මෝටර් වාහන සහ යන්ත්‍ර මහා නගර සභාවේ නමට අයිතිය මාරු කරගත යුතු වේ. | මේ සම්බන්ධ විස්තර රැස්කරගෙන යනු ලැබේ. |
| (ඈ) | ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් විෂය භාර නිලධාරි සහ තාක්ෂණ සේවා නිලධාරින් යන අය විසින් නිසි පරිදි පරීක්ෂා නොකර සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම හේතුවෙන් 2018 වර්ෂයේදි සියයට 50 කට වඩා වැඩි අයදුම්පත් සඳහා අනුමැතිය ප්‍රතික්ෂේප වී ඇත. මේ හේතුවෙන් අයදුම්කරුවන් නොයෙක් දුෂ්කරතාවයන්වලට මුහුණ දී ඇත. | නිවාස ඉදි කිරීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් විෂයභාර නිලධාරි සහ තාක්ෂණ සේවා නිලධාරිවිසින් අයදුම්පත් නිසිලෙස පරීක්ෂණ කළ යුතු වේ. | මෙම කරුණු සම්බන්ධයෙන් අදාල විෂයභාර නිලධාරින්ට දැනුවත් කර ඇත. |
| (ඉ) | 2017 අප්‍රේල් 19 දින හා අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණ කිරීමේ යන්ත්‍ර භාවිතා කළයුතු වුවද මහා නගර සභාවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින්ගේ පැමිණීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණ යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | 2017 අප්‍රේල් 19 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මාණ්ඩලික ශ්‍රේණිය නිලධාරින්ගේ පැමිණීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණ කිරීමේ යන්ත්‍ර භාවිතා කළ යුතු වේ. | 2019 ජුනි මස සිට සියළුම නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමට කටයුතු කර ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සේවක පුරප්පාඩු 43 ක් විය | සභාවේ පවතින පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නැගෙනහිර පළාත් පාලන කොමසාරිස් මගින් කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 2017 වර්ෂයට පෙර වැඩ තහනම් කළ නිලධාරින් 02 දෙනකුගෙන් සහ විශ්‍රාම ගිය නිලධාරින් 02 දෙනකුගෙන් අයවියයුතු හිඟ ශේෂය වන රු. 99,695 ක් අයකර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | • වැඩ තහනම් කළ නිලධාරින්ගේ හිඟ ශේෂය ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br>• විශ්‍රාමිකයන්ගේ හිඟ මුදල විශ්‍රාම දෙපාර්තමේන්තුව හා සම්බන්ධවී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභාවේ වරිපනම් බදු අයකිරීම සඳහා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ස්ථිර නිලධාරින් 04 ක් සහ තාවකාලික නිලධාරින් 04 ක් පත්කර කම්වු 04 වශයෙන් වෙන්කර තිබුණද, වරිපනම් බදු අයකිරීම සම්බන්ධයෙන් දෛනිකව අයකර ගතයුතු අවම ප්‍රමාණය, දෛනිකව නිකුත්කළ යුතු වරිපනම් බදු දැන්වීම් වල ප්‍රමාණය යන රාජකාරි නිසි පරිදි පවරා නොතිබීමෙන් රාජකාරි වේලාවතුල නිකුත්කළ වරිපනම් බදු නිවේදන දෙන ලද නිවාස සංඛ්‍යාව රාජකාරි කළ කාල සීමාව සැබෑ කළ වැඩ වාර්තා යන සාක්ෂි ලබාගැනීමට නොහැකිවිය. | නිසි කළමනාකරණයක් ඇතිකර ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැන් අවශ්‍ය කටයුතු කර ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු මෝටර් වාහන සහ යන්ත්‍ර 13 ක් වර්ෂ එකකට වඩා වැඩි කාලයක් අළුත්වැඩියා කිරීමකින් තොරව පැවතුනද, එවා අළුත්වැඩියා කිරීමටද , ප්‍රයෝජනයට | නිසි කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සභාවේ අනුමැතිය ලබාගෙන කටයුතු කරනු ලැබේ. |

ගත නොහැකි තත්වයේ තිබූ වාහන හා යන්ත්‍ර 23 ක් වෙන්දේසියේ විකිණීමට හෝ විනාශ කිරීමට ද කටයුතු කර නොතිබුණි.

### 3.5.2 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ගිනි නිවීමේ හමුදා අංශයේ ආරක්ෂක උපකරණ, ගිනි නිවන උපකරණ, වතුර බට, සවිකිරීම් වසර දෙකකට වැඩි කාලයක් අළුත්වැඩියා නොකර තිබීමෙන්මහජන සේවයලබා දිමට නොහැකිව ඇත. | මහා නගර සභා බල ප්‍රදේශයේ මහජන සුභ සාධනය සඳහා උපරිම සේවය ලබා දීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ මෙය නිවැරදි කරමි. |
| (ආ) නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය ආධාර යටතේ මහා නගර සභා බල ප්‍රදේශයට අයත් කල්මුණේ සහ සායින්තමරුදු ප්‍රදේශයේ ළමා මුහුදු වෙරළ උද්‍යානය සඳහා පිළිවෙලින් රු. 26,780,072 සහ රු. 8,267,830 ක් වැය කර ඉදිකර තිබුණි. එය සභාව විසින් ප්‍රයෝජනයට ගෙන නොතිබීමෙන් එහි සවිකර ඇති උපකරණ හා භාණ්ඩ ආරක්ෂා රහිතව සහ හානියට පත්ව සහ හරක් ගැවසෙන ස්ථානයක් බවට පත්වී තිබුණි. | මහා නගර සභා බල ප්‍රදේශයේ මහජන සුභ සිද්ධිය වැඩි කිරීමේ අදහසින් ළමා මුහුදු වෙරළ උද්‍යානය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර එහි සවිකර ඇති උපකරණ හා භාණ්ඩ ආරක්ෂා කර ගත යුතු වේ. | ඉදිරි කාලයේදි සකස්කිරීමට කටයුතු කරමි. |

### 3.6 ප්‍රසම්පාදනය

**ප්‍රසම්පාදන සැලස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලයේදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් | විගණන හා කළමනාකරණ කමිටු | ලබන වර්ෂයේදි ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කරනු |

| | | |
|---|---|---|
| පවත්වා නොතිබුණි. | පිහිටුවා රැස්වීම් පවත්වීමට කටයුතු කළ යුතු වේ. | ලැබේ. |

**4.2 නොවිසඳි ඇති විගණන නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්යාල ව්‍යුහය පිළිබඳ දැන්වීම් පුවරු සකස් කිරීම සඳහා 2013 වර්ෂයේදි රු. 123,000 ක ගෙවීමක් කර තිබුණද, 2018 ඔක්තෝබර් 18 දිනය දක්වා අදාල පුවරු සවිකර නොතිබුණි. | අදාල පුවරුව සවිකිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල වතුරශ්‍රයේ නැගෙනහිර දිසාවේ සාන්තාන්කේනි පිට්ටනියේ විශාල රැස්වීමක් පවත්වුනි. ඒ අවස්ථාවේදි පිට්ටනිය සකස්කිරීම සඳහා විශාල ප්‍රමාණයේ යන්ත්‍ර උපකරණ භාවිතා කරන ලදි. එම යන්ත්‍ර ක්‍රියා කිරීම සඳහා, නැවත සම්කිරීමේ අදහසින් නාම පුවරුව ගලවන ලදි. නමුත් මේ දක්වා සවිකර නොතිබුණි. අදාල නාම පුවරු තැබූ ස්ථානය සොයා ගැනීම නොහැක. ඒ සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අභ්‍යන්තර විගණන අංශයට දන්වා ඇත. |
| (ආ) | මස්කඩ බදුකුලි ඇප මුදලට අදාලව රු. 544,154 ක් වටිනා චෙක්පත් 06 ක් 2012 වර්ෂයේ බැංකුවේ තැන්පත් කළපසු අගරු වී ඇත. මෙයට වගකියයුතු නිලධාරින් මේ සම්බන්ධයෙන් කිසිම කටයුත්තක් කර නොතිබුණද, ඔහුට විරුද්ධව විනයානුකුල කටයුතු කර නොතිබුණි. | නිලධාරියාට විරුද්ධව කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලියවිලි නොතිබුණි. |
| (ඇ) | සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2009 වර්ෂයේ ලබාදුන් අරමුදල් අදාල අරමුණ සඳහා යොදා ගැනීමකින් තොරව රු. මිලියන 03 ක් ස්ථාවර තැන්පත් වල සහ රු. 2,468,590 ක් ජංගම ගිණුමේද තැන්පත් කර තිබුණි. | ලබාදුන් අරමුදල අදාල අරමුණ සඳහා යොදවා ගැනීමට කටයුතු කළයුතු වේ. | පළාත් සංවර්ධන වැඩ සඳහා අනාගතයේදි අරමුදල් අවශ්‍යා වන අවස්ථාව ලදි. ස්ථාවර තැන්පත් ගිණුමේ තිබෙන මුදල ආපසු ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | මහ නගර සභාවේ නගරාධිපති විසින් 2014 දෙසැම්බර් සිට 2015 පෙබරවාරි දක්වාවූ මාස තුනක් සඳහා රු. 13,011 ක් වටිනා ජංගම දූරකථන බිල්පත් 2015 වර්ෂයේ දෙවතාවක් ගෙවීම් කර | අවශ්‍යා කටයුතු කර අයකර ගත යුතු වේ. | උක්ත කරුණු සම්බන්ධයේන් වැඩිපුර ගෙවන ලද මුදල ආපසු ගෙවන ලෙස හිටපු සභාපතිතුමාට ලියාපදිංචි තැපැලෙක දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | තිබුණද, මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) | මහ නගර සභා අරමුදල යොදවා රු. 124,969 ක මුදලකට පාසල් ළමුන් සඳහා ඉගෙන ගැනීමේ උපකරණ මිලදී ගෙන 2015 ජුනි 30 දින කල්මුණේ අල් - අමීන් විද්‍යාලයට භාරදුන් බව කීවද, 2017 සැප්තැම්බර් 25 දින එම විදුහලේ විදුහල්පතිගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශය අනුව, එම භාණ්ඩ එම වදුහලට ලබා දී නොතිබුණි. | විදුහලට භාරදීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | ඉහත භාණ්ඩ අදාල විදුහල ලබාගත් බවට සාක්ෂි සති දෙකක් ඇතුලත ඉදිරිපත් කරන ලෙසත්, එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එම මුදල අයකිරීමට කටයුතු කරන බව හිටපු මහා නගර සභාවේ මන්ත්‍රීට ලියුම් යවා ඇත. |